සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2022 ජනවාරි

## (101) මූල්‍ය ගිණුම්කරණය

(Financial Accounting)

2022-03-26
සෙනසුරාදා
[09.00 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සැම ප්‍රශ්නයකම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් කාණ්ඩ අතුරෙන්, ආදායම් ප්‍රකාශනයේ මූලිකාංග සමන්විත වන්නේ කුමන කාණ්ඩයේ ද?

(1) වත්කම් සහ වගකීම්.
(2) ආදායම් සහ වියදම්.
(3) වියදම් සහ ස්කන්ධය.
(4) ආදායම් සහ වගකීම්.

**1.2** "**සමන් ට්‍රේඩර්ස්,** රු.85,000/- ක් වටිනා භාණ්ඩ, **සීමාසහිත ABC සමාගමට** ණයට විකුණන ලදී."

ඉහත ගනුදෙනුව වාර්තා කිරීමට **සමන් ට්‍රේඩර්ස්** විසින් නිකුත් කරන නිවැරදි මූලාශ්‍ර ලියවිල්ල වන්නේ:

(1) ගැනුම් ඉන්වොයිසියයි.
(2) ගෙවීම් වවුචරයයි.
(3) විකුණුම් ඉන්වොයිසියයි.
(4) හර පතයි.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, ජංගම වත්කමක් සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) වෙළෙඳ ණයහිමියෝ.
(2) උපචිත විදුලිය.
(3) වෙළෙඳ ණයගැතියෝ.
(4) බැංකු ණය.

**1.4** 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කේවලස්වාමි ව්‍යාපාරයක් වන **නවීන් ට්‍රේඩර්ස්** හි, පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී:

| | රු. |
|---|---|
| 2021 මාර්තු 31 දිනට මුළු වත්කම් | 2,400,000 |
| 2020 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 1,500,000 |
| වර්ෂය තුළ සිදුකළ ගැනිලි | 200,000 |
| 2021 මාර්තු 31 දිනට වගකීම් | 900,000 |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය වූයේ:

(1) රු.2,200,000/-. (2) රු.1,800,000/-. (3) රු.700,000/-. (4) රු.200,000/-.

**1.5** රු.300,000/- ක් වටිනා කාර්යාල උපකරණ සහ මුදලින් රු.500,000/- ක් යොදවමින් **සොයිසා** ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී.

ඉහත ගනුදෙනුව සම්බන්ධයෙන් ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම පහත සඳහන් ඒවා අතුරෙන් තෝරන්න:

| | වත්කම් (රු.) | = | ප්‍රාග්ධනය (ස්කන්ධය) (රු.) | + වගකීම් (රු.) |
|---|---|---|---|---|
| (1) | + 500,000 | = | + 500,000 | - |
| (2) | + 800,000 | = | + 800,000 | - |
| (3) | + 800,000 | = | + 500,000 | + 300,000 |
| (4) | + 200,000 | = | + 200,000 | - |

**1.6** පහත සඳහන් ඒවා අතුරෙන්, පොදු ජර්නලයේ වාර්තා කරනු ලබන්නේ කුමක් ද?

(1) කාර්යාලයේ භාවිතය සඳහා මෝටර් රථයක් ණයට මිලදී ගැනීම.

(2) ණයට මිලදී ගත් භාණ්ඩ, ණයහිමියාට ආපසු හරවා යැවීම.

(3) කාර්යාලයේ භාවිතය සඳහා පරිගණකයක් අත්පිට මුදලට මිලදී ගැනීම.

(4) ණයට භාණ්ඩ විකිණීම.

**1.7** වගකීම් වැඩිවීමට බලපාන ගනුදෙනුව වන්නේ:

(1) මෝටර් රථයක් අත්පිට මුදලට මිලදී ගැනීම. (2) වෙළෙඳ ණයහිමියෙකුගේ ඉන්වොයිසියක් පියවීම.

(3) බැංකුවකින් ණය මුදලක් ලබා ගැනීම. (4) ණයට භාණ්ඩ විකිණීම.

**1.8** "ව්‍යාපාරයේ අයිතිකරුගේ දුරකතන බිල්පත, ව්‍යාපාරය විසින් ගෙවන ලද අතර, එය ව්‍යාපාරයේ ගැනිලි ලෙස සලකා තිබේ."

ඉහත සැලකීමට අදාළවන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) උපචිත සංකල්පයයි. (2) අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි.

(3) ගැලපුම් සංකල්පයයි. (4) අස්තිත්ව සංකල්පයයි.

**1.9** සමාගමක්, 2018 අප්‍රේල් 01 දින රු.2,000,000/- කට යන්ත්‍රයක් අත්පත් කරගත් අතර, එය සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් ක්ෂය කරනු ලැබේ. 2021 මාර්තු 31 දිනට යන්ත්‍රයේ ධාරණ අගය (ලියාහළ අගය) වූයේ:

(1) රු.1,200,000/-. (2) රු.800,000/-. (3) රු.1,600,000/-. (4) රු.400,000/-.

**1.10** පහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශය තෝරන්න:

(1) ශේෂ පිරික්සුම එකඟ වන්නේ නම්, ගිණුම් පොත්වල වැරදි තිබිය නොහැකිය.

(2) ආරක්ෂණ සංකල්පය අනුව, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත තොග අගය කරනු ලැබේ.

(3) පොදු ලෙජරය, මූලික සටහන් පොතකි.

(4) බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙළ කරනු ලබන්නේ ව්‍යාපාර අස්තිත්වයේ බැංකුව විසිනි.

*අංක **1.11** සිට **1.15** දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** අවංකබව යනු ගිණුම්කරණ ශිල්පියෙකු විසින් අනුගමනය කරනු ලබන ආචාරධර්ම සංග්‍රහයේ මූලධර්මයකි.

**1.12** දෛනික ගැනුම් පොතේ ගනුදෙනුවක් වාර්තා කිරීම සඳහා භාවිත කරන මූලාශ්‍ර ලියවිල්ල, හරපත වේ.

**1.13** අස්තිත්වයක සියලුම වගකීම් අඩු කිරීමෙන් පසු වත්කම්වල ඉතිරිවන හිමිකම ස්කන්ධය වේ.

**1.14** කෘත්‍රිම බුද්ධියේ [Artificial Intelligence (AI)] භාවිතය, ගිණුම්කරණ පරිසරයට සමාජීය සහ සංස්කෘතිමය සාධකයකි.

**1.15** සෑම ව්‍යාපාර ගනුදෙනුවකටම ද්විත්ව පැතිකඩක් (dual aspect) තිබේ.

*අංක **1.16** සිට **1.20** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.16** මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) ශේෂය සහ බැංකු ප්‍රකාශනයේ දැක්වෙන ශේෂය අතර වෙනස සඳහා විය හැකි හේතු දෙකක්(02) සඳහන් කරන්න.

**1.17** ගිණුම්කරණ ක්‍රියාවලියේ ගිණුම්කරණ නිමැවුම් දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

**1.18** පරිගණකගත ගිණුම්කරණයේ අවාසි (අඩුපාඩු) දෙකක්(02) හඳුනා දක්වන්න.

**1.19** "වත්කමක්" යන පදය නිර්වචනය කරන්න.

**1.20** පහත සඳහන් තොරතුරු 2021 මාර්තු මාසය සඳහා අමිත් **ට්‍රේඩර්ස්** හි පොත්වලින් උපුටාගන්නා ලදි:

| | **රු.** |
|---|---|
| 2021 මාර්තු 01 දිනට වෙළෙඳ ගෙවිය යුතු මුදල් (ණයහිමි) පාලන ගිණුමේ ශේෂය | 475,000 |
| මාසය සඳහා දෛනික ගැනුම් පොතේ එකතුව | 1,250,000 |
| මාසය සඳහා ආපසු යැවුම් ජර්නලයේ එකතුව | 125,000 |
| මාසය තුළදී වෙළෙඳ ණයහිමියන්ට සිදුකළ ගෙවීම් | 600,000 |

2021 මාර්තු 31 දිනට වෙළෙඳ ගෙවිය යුතු මුදල් (ණයහිමි) පාලන ගිණුමේ ශේෂය හඳුනා දක්වන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

## 02 වන ප්‍රශ්නය

**සැම්,** 2020 අප්‍රේල් 01 දින මුදලින් රු.3,000,000/- ක් ආයෝජනය කරමින් **සැම් ට්‍රේඩර්ස්** නම් වූ කේවලස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) සාරාංශය පහත දැක්වේ:

**මුදල් පාලන ගිණුම (මුදල් පොත)**

| | **රු.** | | **රු.** |
|---|---|---|---|
| මූලික ප්‍රාග්ධන ආයෝජනය | 3,000,000 | වෙළෙඳ ණයහිමියන්ට කළ ගෙවීම් | 2,200,000 |
| අත්පිට විකුණුම් | 2,000,000 | අත්පිට ගැනුම් | 900,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 3,600,000 | සුළු මුදල් | 25,000 |
| | | විදුලිය | 25,000 |
| | | වැටුප් සහ වේතන | 1,000,000 |
| | | කාර්යාල කුලිය | 350,000 |
| | | මෝටර් වාහනයක් මිලට ගැනීම<br>(2020 අප්‍රේල් 01 දින අත්පත් කරගන්නා ලදි) | 1,500,000 |
| | | ශේෂය ප/ගෙ | 2,600,000 |
| | **8,600,000** | | **8,600,000** |
| ශේෂය ඉ/ගෙ | 2,600,000 | | |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2021 මාර්තු 31 දිනට, ලැබිය යුතු සහ ගෙවිය යුතු මුදල් ශේෂ පහත පරිදි වේ:

| | **රු.** |
|---|---|
| වෙළෙඳ ණයගැතියෝ | 750,000 |
| වෙළෙඳ ණයහිමියෝ | 440,000 |
| උපචිත විදුලිය | 6,500 |

(2) මෝටර් වාහන වාර්ෂිකව, පිරිවැය මත 25% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

(3) සුළු මුදල් ගනුදෙනු පහත සඳහන් පරිදි විය:

**සුළු මුදල් පාලන ගිණුම**

| | රු. | | රු. |
|---|---|---|---|
| මුදල් පාලන ගිණුම | 25,000 | මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය | 4,500 |
| | | ගමන් වියදම් | 8,000 |
| | | කාර්යාල නඩත්තු | 6,500 |
| | | ශේෂය ප/ගෙ | 6,000 |
| | **25,000** | | **25,000** |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021 මාර්තු 31 දිනට **සෑම් ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

(A) 2021 මාර්තු 31 දිනට **සීමාසහිත සීනා සමාගමේ** බැංකු ප්‍රකාශනය අනුව වාසිදායක ශේෂය වූ රු.306,500/-, එදිනට මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) හර ශේෂය (වාසිදායක) වූ රු.345,000/- සමඟ එකඟ නොවීය.

වෙනස සඳහා හේතු පහත දැක්වේ:

(1) සමාගම විසින් 2021 මාර්තු 30 දින තැන්පත් කරන ලද රු.75,000/- ක චෙක්පත, 2021 මාර්තු 31 දින වන විට උපලබ්ධි වී නොතිබුණි.

(2) 2021 මාර්තු 26 දින නිකුත් කරන ලද පහත සඳහන් චෙක්පත්, 2021 මාර්තු 31 දිනවන විට ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණි:

| චෙක්පත් අංක | වටිනාකම (රු.) |
|---|---|
| 143346 | 28,000 |
| 143349 | 4,500 |

(3) 2021 මාර්තු 31 දින, පොලී ආදායමක් වශයෙන් රු.6,500/- ක් බැංකුවට සෘජුවම ලැබී තිබුණි. මෙය මුදල් පොතේ වාර්තා කර නොතිබුණි.

(4) බැංකුව, 2021 මාර්තු මාසය සඳහා වන බැංකු ගාස්තු වශයෙන් රු.2,500/- ක් අඩුකර තිබූ අතර, එය මුදල් පොතේ වාර්තාකර නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ගලපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත). (ලකුණු 03)

(b) 2021 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය. (ලකුණු 02)

(B) කේවලස්වාමි ව්‍යාපාරයක පහත දැක්වෙන ගනුදෙනු පහ (5) මගින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම ඔබට දී ඇත:

| | වත්කම් | | | = | ස්කන්ධය (ප්‍රාග්ධනය) | + | වගකීම් |
|---|---|---|---|---|---|---|---|
| | තොගය | වෙළෙඳ ණයගැතියෝ | මුදල් | | | | වෙළෙඳ ණයහිමියෝ |
| (1) | | | +1,000,000 | = | + 1,000,000 | | |
| (2) | + 600,000 | | | = | | | + 600,000 |
| (3) | (500,000) | + 600,000 | | = | + 100,000 | | |
| (4) | | | (400,000) | = | | | (400,000) |
| (5) | | | (50,000) | = | (50,000) | | |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත (1) සිට (5) දක්වා ඇති එක් එක් අයිතමය සඳහා සිදුවිය හැකි ගනුදෙනුව **හඳුනා දක්වන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## **04** වන ප්‍රශ්නය

**රන්සිරි ට්‍රේඩර්ස්** නිත්‍ය නිෂ්පාදකයෙක් වන අතර, පහත සඳහන් තොරතුරු 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **රන්සිරි ට්‍රේඩර්ස්** හි පොත්වලින් උපුටා ගන්නා ලදි:

| **විස්තරය** | **රු.** |
|---|---|
| අමුද්‍රව්‍ය මිලට ගැනුම් | 2,771,000 |
| අමුද්‍රව්‍ය ගෙනඒමේ කුලී | 29,000 |
| සෘජු වේතන | 920,000 |
| රක්ෂණය | 328,000 |
| කම්හල් කළමනාකරුගේ වැටුප | 900,000 |
| විදුලිය | 420,000 |
| ක්ෂය - පිරියත සහ යන්ත්‍ර | 450,000 |
| ක්ෂය - කම්හල් ගොඩනැගිල්ල | 180,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) තොග පහත පරිදි අගය කර තිබේ: *(රු.)*

| **විස්තරය** | **2020 අප්‍රේල් 01 දිනට** | **2021 මාර්තු 31 දිනට** |
|---|---|---|
| අමුද්‍රව්‍ය | 900,000 | 875,000 |
| නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ) | 175,000 | 420,000 |

(2) පහත වියදම්, පහත සඳහන් පරිදි බෙදා වෙන්කළ යුතුය:

| වියදම් | කම්හල | කාර්යාලය |
|---|---|---|
| විදුලිය | 80% | 20% |
| රක්ෂණය | 60% | 40% |

(3) නිෂ්පාදනය කරන ලද නිෂ්පාදිත, නිෂ්පාදන පිරිවැය මත 15% ක ලාභ ආන්තිකයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **රත්සිරි ට්‍රේඩර්ස්** හි නිෂ්පාදන පිරිවැය ලේඛණය (නිෂ්පාදන ගිණුම) **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

**KTI ට්‍රේඩර්ස්** යනු **අමල්ට** අයිති තේවලස්වාමි ව්‍යාපාරයකි. 2021 මාර්තු 31 දිනට **KTI ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම එකඟ නොවූ අතර, වෙනස අවිනිශ්චිත ගිණුමකට බැර කර කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදි. කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු.2,250,000/- ක ශුද්ධ ලාභයක් වාර්තා කර තිබුණි.

පහත දැක්වෙන වැරදි පසුව හඳුනා ගන්නා ලදි:

(1) 2021 මාර්තු 31 දින රු.335,000/- ක පිරිවැයකට කාර්යාල උපකරණයක් මිලට ගැනීම, කාර්යාල උපකරණ නඩත්තු ගිණුමට හර කර තිබුණි. මෙය මුදල් පොතේ නිවැරදිව වාර්තා කර තිබුණි.

(2) 2021 අප්‍රේල් මාසයේදී ගෙවන ලද 2021 මාර්තු මාසයට අදාලවන කුලී වියදම වූ රු.80,000/- ගිණුම් පොත්වල වාර්තා කර නොතිබුණි.

(3) රු.95,000/- ක් වටිනා ණය පදනමට ගත් ගැනුම් ඉන්වොයිසියක් ගිණුම් පොත්වල සම්පූර්ණයෙන්ම වාර්තා කිරීමට මගහැරී තිබේ.

(4) දෛනික විකුණුම් පොතේ එකතුව රු.90,000/- කින් අඩුවෙන් සටහන් කර තිබුණි.

(5) බැංකුවෙන් ලද රු.29,000/- ක පොලී ආදායමක්, පොලී වියදම් ගිණුමට හර කර තිබුණි. නමුත් එය නිවැරදිව මුදල් පොතේ වාර්තා කර තිබුණි.

(6) රු.145,000/- ක් වූ විදුලි වියදම, විදුලි වියදම් ගිණුමේ රු.154,000/- ක් ලෙස සටහන් කර තිබූ නමුත්, අදාල බැර සටහන නිවැරදිව සටහන් කර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් **පිළියෙල කරන්න**. (ලකුණු 06)

(b) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගලපන ලද / නිවැරදි කරන ලද ශුද්ධ ලාභය **ගණනය කරන්න**.
(ලකුණු 04)
(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

**සන්ශයින් ට්‍රේඩර්ස්** කේවලස්වාමි ව්‍යාපාරයකි. 2021 මාර්තු 31 දිනට **සන්ශයින් ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම පහත දැක්වේ:

**සන්ශයින් ට්‍රේඩර්ස්**

**2021 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට: | | |
| ඉඩම සහ ගොඩනැගිල්ල (ඉඩමේ වටිනාකම - රු.6,000,000/-) | 16,000 | |
| මෝටර් වාහන | 2,800 | |
| කාර්යාල උපකරණ | 900 | |
| 2020 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිල්ල | | 2,000 |
| මෝටර් වාහන | | 600 |
| කාර්යාල උපකරණ | | 450 |
| විකුණුම් | | 125,000 |
| ගැනුම් | 76,000 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 7,200 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 3,200 |
| අතැති මුදල් | 900 | |
| බැංකු අයිරාව | | 1,750 |
| 2020 අප්‍රේල් 01 දිනට තොගය | 6,900 | |
| විදුලිය | 3,200 | |
| වැටුප් සහ වේතන | 30,000 | |
| දුරකතන ගාස්තු | 2,000 | |
| ප්‍රචාරණය | 4,000 | |
| ගෙවූ ප්‍රදර්ශනාගාර කුලී | 550 | |
| මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය | 1,200 | |
| බැංකු අයිරාව මත පොලිය | 300 | |
| බැංකු ගාස්තු | 50 | |
| 2020 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | 19,000 |
| | **152,000** | **152,000** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2021 මාර්තු 31 දිනට අවසාන තොගය රු.7,200,000/- ක පිරිවැයකට අගය කරන ලදී.

(2) **සන්ශයින් ට්‍රේඩර්ස්,** 2021 ජනවාරි 01 දින මෝටර් බයිසිකලයක් රු.300,000/- කට **සීමාසහිත සිටි රයිඩර්ස් සමාගමෙන්** ණයට මිලදී ගන්නා ලදී. මෙය **සන්ශයින් ට්‍රේඩර්ස්** හි 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ගිණුම් පොත්වල සටහන් කර නොමැත.

(3) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, පහත පරිදි පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි:

| | | |
|---|---|---|
| ගොඩනැගිල්ල | : | වර්ෂයකට 5% බැගින් |
| මෝටර් වාහන | : | වර්ෂයකට 20% බැගින් |
| කාර්යාල උපකරණ | : | වර්ෂයකට 20% බැගින් |

(4) 2020 අප්‍රේල් 01 දින වර්ෂයක කාලයක් සඳහා ප්‍රදර්ශනාගාරයේ කුලී ගිවිසුමට එළඹෙන ලදී. මාසික ප්‍රදර්ශනාගාර කුලිය රු.50,000/- කි.

(5) 2021 මාර්තු මාසය සඳහා පහත සඳහන් වියදම්, ගිණුම් පොත්වල උපචිත කර නොමැත:

| | | |
|---|---|---|
| විදුලි බිල්පත | : | රු.175,000/- |
| ප්‍රචාරණය | : | රු. 25,000/- |

(6) 2021 මාර්තු 31 දිනට පැවති වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂය ඇගයීමෙන් පසු, **සන්ශයින් ට්‍රේඩර්ස්** හි හිමිකරු රු.800,000/- ක ශේෂයක් බොල්ණය ලෙස ලියා හැරීමට තීරණය කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 12)

(b) 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 08)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසදීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |